**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

# පිරියත සහ යන්ත්‍රෝපකරණ රක්ෂණ ඔප්පුව - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය

**ඔප්පු වර්ගය:** පිරියත සහ යන්ත්‍රෝපකරණ රක්ෂණය

## ලබා දෙනු ලබන මූලික ආවරණය:

ඔප්පුවේ සඳහන් ස්ථානයේ හෝ භූගෝලීය ප්‍රදේශයේ රඳවන ලද රක්ෂිත අයිතමයට, අලුත්වැඩියාවක් හෝ ප්‍රතිස්ථාපනයක් අවශ්‍ය වන ආකාරයෙන් විශේෂයෙන් බැහැර නොකළ ඕනෑම හේතුවක් නිසා අනපේක්ෂිත, බාහිර හා හදිසි භෞතික අලාභයක් හෝ හානියක් සිදුවුවහොත්, රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට මුදල් ගෙවීමෙන්, ප්‍රතිස්ථාපනය කිරීමෙන් හෝ අලුත්වැඩියාව මගින් වන්දි ලබා දෙනු ඇත.

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා, කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02 බලන්න)*

## අමතර ආවරණ (අමතර වාරිකයක් ගෙවා මෙම අමතර ආවරණය ලබා ගත හැකිය):

- වැඩවර්ජන, කැරලි කෝලාහල සහ මහජන කැලඹීම්
- ත්‍රස්තවාදය
- ප්‍රවාහන ආවරණය

## ප්‍රධාන ලක්ෂණය(යන්):

- මෙය සියලු අවදානම් ආවරණ සහිත රක්ෂණ ඔප්පුවකි.

## විධිවිධාන:

එක හා සමාන වර්ගයේ සහ එකම ධාරිතාවයෙන් යුත් නව අයිතමයක් මගින් රක්ෂිත අයිතමය ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයට රක්ෂිත මුදල සමාන විය යුතු වීම, මෙම රක්ෂණ ඔප්පුවේ එක් අවශ්‍යතාවයකි. එහි අර්තය වන්නේ, උදාහරණයක් වශයෙන් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු, රේගු බදු (අදාල වන්නේ නම්) සහ ඉදිකිරීම් පිරිවැය ඇතුලුව, ඒවායේ ප්‍රතිස්ථාපන පිරිවැය යන්නයි. රක්ෂණය කළ යුතුව තිබූ ප්‍රමාණයට වඩා රක්ෂිත මුදල අඩු නම් රක්ෂණ සමාගම ගෙවිය යුතු වන්නේ, රක්ෂණය කිරීමට අවශ්‍ය මුදලට රක්ෂිත මුදල දරන සමානුපාතික ප්‍රමාණය පමණයි. එකකට වඩා වැඩි සෑම අයිතමයක්ම මෙම කොන්දේසියට වෙන වෙනම යටත් වේ.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "විධිවිධාන" කොටස බලන්න*

## ආවරණය නොවන දේ (පොදු ව්‍යතිරේක):

1) උපලේඛනයේ සඳහන් කර ඇති අඩුකිරීම්

2) විදුලි හෝ යාන්ත්‍රික බිඳ වැටීම්, අසමත්වීම්, කැඩීයාම හෝ අක්‍රියවීම, සිසිලනකාරකය හෝ වෙනත් දියර වර්ග කැටි වීම, ලිහිසි තෙල් දෝෂ, තෙල් හෝ සිසිලනකාරකය නොමැතිකම හේතුවෙන් සිදුවන අලාභය හෝ හානි. එහෙත්, එවැනි බිඳ වැටීමක හෝ අක්‍රියතාවයක අනුශංගයක් ලෙස හදිසි අනතුරක් ඇතිවුවහොත්, එවැනි අනුශංගික හානි හානිපූරණය කරනු ලැබිය යුතුය.

3) බ්‍රිට්, ඩ්‍රිල්, පිහි හෝ වෙනත් කැපුම් දාර, කියත් තල, අච්චු, රටා, කුඩු කිරීමේ සහ තලා දැමීමේ මතුපිට, තිර සහ පෙරහන්, ලණු, පටි, දම්වැල්, සෝපානය සහ සම්ප්‍රේශක පටි, බැටරි, ටයර්, සම්බන්ධක වයර් සහ කේබල්, නම්‍යශීලී පයිප්ප, නිතිපතා ප්‍රතිස්ථාපනය කරනු ලබන ඇමුණුම් සහ ඇසුරුම් ද්‍රව්‍ය වලට සිදුවන අලාභ හෝ හානි,

4) අභ්‍යන්තර වාෂ්ප හෝ ද්‍රව පීඩනයට යටත්ව, ඕනෑම බොයිලේරුවක් හෝ පීඩන භාජනයක් හෝ ඕනෑම අභ්‍යන්තර දහන එන්ජිමක් පුපුරා යාමෙන් සිදුවන හානිය,

5) ඉදිකිරීම් ස්ථානවල පමණක් මෙම වාහන භාවිතා කරන්නේ නම් මිස, සාමාන්‍ය මාර්ග භාවිතය සඳහා නිර්මාණය කර බලපත්‍ර ලබාදී ඇති වාහන වලට සිදුවන අලාභ හෝ හානි.

6) ජල යාත්‍රා හෝ බෝට්ටුවලට සිදුවන අලාභ හෝ හානි.

7) උදම් රළ ජලයේ සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් යටවීම හේතුවෙන් සිදුවන අලාභ හෝ හානි.

8) පිටසනක් හරහා එකහවී තිබුණහොත් මිස, ප්‍රවාහනයේදී සිදුවන අලාභ හෝ හානි.

9) අඛණ්ඩව ක්‍රියාත්මක වීමේ සෘජු අනුශංගයක් වශයෙන් (උදා: ගෙවීයාම් සහ වැහැරීයාම්, විබාදනයවීම්, මලකඩකෑම්, භාවිතයක් නොමැතිකම නිසා සහ සාමාන්‍ය වායුගෝලීය තත්ත්වයන් හේතුවෙන් පිරිහීම) සිදුවන අලාභ හෝ හානි.

10) ඕනෑම රක්ෂිත අයිතමයක් ඕනෑම ආකාරයක පරීක්ෂණයකට භාජනය වන අතරවාරයේ හෝ එය නිර්මාණය කර ඇති අරමුණ හැර වෙනත් ආකාරයක අරමුණක් සඳහා භාවිතා කරන අතරතුර සිදුවන අලාභ හෝ හානි.

11) පිටසනක් හරහා එකහවී තිබුණහොත් මිස, භූගතව ක්‍රියාත්මක වන පිරියත සහ/හෝ යන්ත්‍රෝපකරණ වලට සිදුවන අලාභ හෝ හානි.

12) කැරලි කෝලාහල, වැඩවර්ජන, ත්‍රස්තවාදය සහ යුද්ධය.

13) න්‍යෂ්ටික ප්‍රතික්‍රියා, න්‍යෂ්ටික විකිරණ හෝ විකිරණශීලී දූෂණය.

14) රක්ෂිතයා හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයින් දැන සිටි මෙම ඔප්පුව ආරම්භ කරන අවස්ථාවේ පැවති කිසියම් දෝෂ හේතුවෙන් සිදුවන අලාභ හෝ හානි. (එවැනි දෝෂ රක්ෂණ සමාගම දැන සිටියද නැද්ද යන්න නොසලකා)

15) රක්ෂිතයාගේ හිතාමතා ක්‍රියාවක් හෝ ඕනෑකමින් සැලකිල්ලක් නොදැක්වීමේ සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් නිසා සිදුවන, පැනනගින හෝ උග්‍රවන අලාභ හෝ හානි.

16) නීතියක් හෝ ගිවිසුමක් යටතේ සැපයුම්කරු හෝ නිෂ්පාදකයා, ඔවුන්ගේ නියෝජිතයින් වගකිව යුතු අලාභ හෝ හානි.

17) ඕනෑම ආකාරයක හෝ විස්තරයක අනුශංගික හානි හෝ වගකීමක්,

18) ඉන්වෙන්ටරිය ගන්නා අවස්ථාවේදී හෝ සාමාන්‍ය නඩත්තු සේවා කාලය තුල පමණක් අනාවරණය වූ අලාභ හෝ හානි.

19) වාහනයේ හෝ යන්ත්‍රයේ කොටස් සොරකම් කිරීම

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "පොදු ව්‍යතිරේක" කොටස බලන්න*

**වාරික ගෙවීමේ ක්‍රමය:**

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

**හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:**

මෙම ඔප්පුව යටතේ හිමිකම් පෑමකට තුඩු දිය හැකි ඕනෑම සිදුවීමක් පිළිබඳව රක්ෂණ සමාගමට වහාම දැනුම් දිය යුතුය. ඕනෑම සිදුවීමක් ඇතිවී දින දහහතරක් (14) ඇතුලත හෝ සමාගම විසින් ලිඛිතව අවසර ලබා දී දීර්ඝ කර ඇති වෙනත් කාලසීමාවක් ඇතුලත නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමයක් සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය:

1. අලාභය/හානිය පිළිබඳව ඔබ දැනගත් වහාම 011-2206306 යන අංකය ඔස්සේ අප අමතන්න.
2. නීතියෙන් නියම කර ඇති පරිදි (සොරකමක්, ද්වේෂසහගත හානියක්, කැරලි කෝලාහල සහ වැඩවර්ජන, ගිනි තැබීම් හෝ සැකසහිත ගිනි තැබීමකදී වැනි) සිද්ධිය පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කරන්න.
3. තෙවන පාර්ශවයක් විසින් කිසියම් හිමිකම් පෑමක් සිදු කරන්නේ නම්, කිසිම පොරොන්දුවක් ඔවුනට ලබා නොදී එය අප වෙත යොමු කරන්න.
4. මෝටර් රථවාහන නොවන හිමිකම් දෙපාර්තමේන්තුව විසින් එවනු ලබන හිමිකම් පෝරමය පුරවා ඔබගේ හිමිකම් ගෙවීම වේගවත් කිරීම සඳහා ඉල්ලා සිටින අනෙකුත් ලියකියවිලි සමග එය හැකි ඉක්මණින් ආපසු එවන්න.
5. දේපල පිළිබඳ හිමිකම් පෑමක් නම්, හානිවූ දේපල නිරීක්ෂණය කිරීම සඳහා තක්සේරුකරුවෙක් හෝ විමර්ශන නිලධාරියෙක් හැකි ඉක්මණින් යවනු ලැබේ.
6. අලාභය/හානිය තක්සේරු කිරීම අලාභයේ ස්වභාවය අනුව සුදුසු අලාභ තක්සේරුකරුවෙක් විසින් සිදු කරනු ලැබේ.
7. අවශ්‍ය ලියකියවිලි:
    - නිසිපරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
    - අදාල වන්නේ නම්, පොලීසියට කරන ලද පැමිණිල්ලේ පිටපතක්
    - ඇස්තමේන්තු සහ බිල්පත්
    - හිමිකම තක්සේරු කිරීමේදී රක්ෂණ සමාගමට අවශ්‍ය විය හැකි වෙනත් අවශ්‍යතා

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, කරුණු අංක 11 යටතේ ''කොන්දේසි'' කොටස බලන්න*

**වංචාව:**

මෙම රක්ෂණ ඔප්පුවේ ඇති ඕනෑම හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් වංචනික නම් හෝ රක්ෂිතයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම අයෙක් විසින් කිසියම් වංචනික ක්‍රමයක් හෝ උපාංගයක් භාවිතා කරන්නේ නම් හෝ හිතාමතාම කරන ලද ක්‍රියාවකින් හෝ රක්ෂිතයාගේ අනුදැනුම ඇතිව යම් විනාශයක් හෝ තුවාලයක් හෝ හානියක් සිදුවුවහොත් මෙම ඔප්පුව යටතේ ඇති සියලුම ප්‍රතිලාභ අහිමි වනු ඇත.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, ''කොන්දේසි'' කොටස යටතේ කරුණු අංක 09-අ බලන්න*

**<u>රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීම්:</u>**

## වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වලක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.

- ඔප්පු කාලසීමාවේදී:- අවදානමේ හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගම දැනුවත් කල යුතුය.

  *කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "ව්‍යතිරේක" කොටස බලන්න*

## හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.

  *කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, කරුණු අංක 06 යටතේ "ව්‍යතිරේක" කොටස බලන්න*

- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීම පිළිබඳ ප්‍රතිඥාභාරයට අනුකූල විය යුතුය.
  *කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, කරුණු අංක 12 යටතේ "ව්‍යතිරේක" කොටස බලන්න*

- රක්ෂිතයා විසින් රක්ෂිත දේපලට සිදුවන අලාභය හෝ හානිය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා සියලු සාධාරණ පූර්වාරක්ෂක පියවර ගත යුතුය.

- එක හා සමාන වර්ගයේ සහ එකම ධාරිතාවයෙන් යුත් නව අයිතමයක් මගින් රක්ෂිත අයිතමය ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයට රක්ෂිත මුදල සමාන විය යුතු වීම, මෙම රක්ෂණ ඔප්පුවේ එක් අවශ්‍යතාවයකි. එහි අර්ථය වන්නේ, උදාහරණයක් වශයෙන් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු, රේගු බදු (අදාල වන්නේ නම්) සහ ඉදිකිරීම් පිරිවැය ඇතුලුව, ඒවායේ ප්‍රතිස්ථාපන පිරිවැය යන්නයි. රක්ෂණය කළ යුතුව තිබූ ප්‍රමාණයට වඩා රක්ෂිත මුදල අඩු නම් රක්ෂණ සමාගම ගෙවිය යුතු වන්නේ, රක්ෂණය කිරීමට අවශ්‍ය මුදලට රක්ෂිත මුදල දරන සමානුපාතික ප්‍රමාණය පමණයි. එකකට වඩා වැඩි සෑම අයිතමයක්ම මෙම කොන්දේසියට වෙන වෙනම යටත් වේ.

- යන්ත්‍රෝපකරණ හැසිරවිය යුත්තේ මුල් රක්ෂිතයා විසින් අනුමත කරන ලද පළපුරුදු / දක්ෂ ක්‍රියාකරුවෙක් විසිනි.

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

**PEOPLE'S INSURANCE**
EMPOWERING A RESILIENT NATION

**<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:</u>**

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකතනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් මගින් - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් මගින් - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපෑලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය මගින් - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර “පැමිණිලි” ටැබ් එක මත ක්ලික් කරන්න
- අපගේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් භාගත කල හැකිය. කරුණාකර “පැමිණිලි” ටැබ් එක මත ක්ලික් කරන්න

**<u>ආරවුල් විසඳීම:</u>**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
නො. 01
බෙතෙස්ඩා පෙදෙස
කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 13 සහ 14, "පැමිණිලි ක්‍රියාපටිපාටිය" කොටස බලන්න*

**<u>මතක තබා ගත යුතු කරුණු කිහිපයක්</u>**

**රක්ෂණය අවලංගු කිරීම:**

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කල හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කල හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, කරුණු අංක 11 යටතේ "කොන්දේසි" කොටස බලන්න*

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිලිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

**<u>වැදගත් සටහන්:</u>**

රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාල වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාල ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**<u>වැඩිදුර තොරතුරු සඳහා:</u>**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකතනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්